**නැගෙනහිර පළාතේ ග්‍රාමීය මාර්ග සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය - 2014**

----------------------------------------------------------------------------

නැගෙනහිර පළාතේ ග්‍රාමීය මාර්ග සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජපාන අන්තර්ජාතික සහයෝගීතා නියෝජිතායතනය අතර එළඹි 2010 මාර්තු 26 දිනැති ණය ගිවිසුම් අංක එස්එල්-පී 97 හි III ව්‍යවස්ථාවේ 4.7 (අ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම , අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

----------------------------------------------------------------------------

නැගෙනහිර පළාතේ ග්‍රාමීය මාර්ග සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව,මුදල් අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර නැගෙනහිර පළාත් සභාව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ආර්ථික කටයුතු හා වෙළඳපල පහසුකම් පරිශීලනය වැඩි දියුණු කිරීම මෙන්ම ග්‍රාමීය මාර්ග ප්‍රතිසංස්කරණය තුළින් සමාජ සේවාවලට ප්‍රවිෂ්ඨ වීම වැඩි දියුණු කිරීම හා එමඟින් දේශීය ආර්ථිකය සංවර්ධනයට දායක වීම හා ප්‍රාදේශීය අසමානතා අවම කිරීම මඟින් නැගෙනහිර පළාත් ජනතාවගේ ජීවන මාර්ගය වැඩි දියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තු මුළු පිරිවැය රු.මිලියන 5,834 කට සමාන ජපන් යෙන් මිලියන 4,664 ක් වූ අතර එයින් රු.මිලියන 4,944 කට සමාන ජපන් යෙන් මිලියන 3,965 ක් ජපාන අන්තර්ජාතික සහයෝගීතා නියෝජිතායතනය විසින් මූල්‍යනය කිරීමට එකග වී ඇත. ව්‍යාපෘතිය එහි කටයුතු 2010 මාර්තු 26 දින ආරම්භ කළ අතර 2014 ජනවාරි වනවිට අවසන් කිරීමට නියමිත විය. කෙසේ වෙතත් 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

----------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4. විගණකගේ වගකීම

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී.ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ

විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිණිස අවශ්‍ය යැයි සලකනු ලැබූ පරීක්ෂා කිරීම්ද පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාල පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වුයේද යන බව.

(ආ) ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලබන වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති වියදම් සතුටුදායක ලෙස සංසන්දනය කර ඇති බව.

(ඇ) ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය යටතේ කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (වි.ප්‍ර.) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි වේද යන බව.

(ඉ) ණය යටතේ කරන ලද ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේද යන බව.

(ඊ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ, ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(උ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව.

(ඌ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(එ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(ඒ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

---

**2.1 මතය**

---

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගතවන ගැලපීම් වලින් ඇති වන බලපෑම් හැර මාගේ මතය වනුයේ,

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව.

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව.

(ඇ) ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (වි.ප්‍ර.) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව.

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඉ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී ඇති බවත්ය.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

---

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

---

සමාලෝචිත වර්ෂය තුළ ණය නියෝජිතායතනය වෙත ගෙවා ඇති ජපන් යෙන් 7,008,734 ක පොලී ගාස්තු හා ජපන් යෙන් 196,032 ක බැඳීම් ගාස්තු ගිණුම් වලට ගෙන නොතිබුණි.

**2.2.2 නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවීම්**

---

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ණය ගිවිසුමේ උප ලේඛන 2 හී 1 වගන්තියට අනුව, දේශීය බදු හා ගාස්තු ණය අරමුදල් මඟින් මූල්‍යයනය කිරීමට නොහැකිය. කෙසේ වෙතත් ඉදිකිරීම් කර්මාන්ත සහතික අරමුදල් බදු වටිනාකම රු. මිලියන 6.06 ක් ණය අරමුදල් මඟින් ප්‍රතිපූර්ණය කර තිබුණි.

(ආ) රු. මිලියන 6.46 ක් වටිනා ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 756 ප්‍රකාරව සමාලෝචිත වර්ෂය අවසානයේදී භාණ්ඩ සමීක්ෂණයන් සිදු කර නොතිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළදී හා 2014 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ සැලකිය යුතු සංඛ්‍යා කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමට අනුව මූල්‍යයනය කිරීමට එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ සිදුකළ වෙන්කිරීම | අරමුදල් උපයෝජනය | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | 2014 වර්ෂය තුළ | | 2014 දෙසැම්බර් 31 දිනට | |
| | ජපන් යෙන් (මිලියන) | රු. (මිලියන) | රු. (මිලියන) | ජපන් යෙන් (මිලියන) | රු. (මිලියන) | ජපන් යෙන් (මිලියන) | රු. (මිලියන) |
| ජ.අ.ස.නි | 3,965 | 4,944 | 575 | 448 | 570 | 3,865 | 5,600 |
| ශ්‍රී.ලං.ර | 699 | 890 | 304 | 186 | 232 | 577 | 836 |
| එකතුව | 4,664 | 5,834 | 879 | 634 | 802 | 4,442 | 6,436 |

### 3.2 භෞතික ප්‍රගතිය

ව්‍යාපෘති ප්‍රගති වාර්තා අනුව ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ දිග කිලෝමීටර 109 ක් සහිත ග්‍රාමීය මාර්ග 97 ක්, මඩකලපු දිස්ත්‍රික්කයේ දිග කිලෝමීටර 134 ක් සහිත ග්‍රාමීය මාර්ග 161 ක් සහ අම්පාර දිස්ත්‍රික්කයේ දිග කිලෝමීටර 116 ක් සහිත ග්‍රාමීය මාර්ග 71 ක් ව්‍යාපෘති කාලය තුළදී කොන්ක්‍රීට් දැමීම මඟින් ප්‍රතිසංස්කරණය කර තිබුණි. කෙසේ වෙතත් ව්‍යාපෘතියේ මූලික සැලසුම් අනුව ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ දිග කිලෝමීටර 110 ක් සහිත ග්‍රාමීය මාර්ග 91 ක්, මඩකලපු දිස්ත්‍රික්කයේ දිග කිලෝමීටර 117 ක් සහිත ග්‍රාමීය මාර්ග 150 ක් සහ අම්පාර දිස්ත්‍රික්කයේ දිග කිලෝමීටර 116 ක් සහිත ග්‍රාමීය මාර්ග 64 ක් ප්‍රතිසංස්කරණය කිරීමට අපේක්ෂිත විය.

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

------------------------

පළාත් සභාව විසින් දියුණු කරන ලද පටිපාටි ප්‍රමාණවත් නොවීම හේතුවෙන් ව්‍යාපෘතිය විසින් යළි ඉදිකළ මාර්ගවල කොන්ත්‍රාත් පරිපාලනය හා තත්ත්ව කළමනාකරණය සම්බන්ධයෙන් නැගෙනහිර පළාත් සභාව විසින් ගනු ලැබූ ක්‍රියාත්මක කිරීමේ හා පසු විපරම් කටයුතු ප්‍රමාණවත් නොවූ බව විගණනයේදී නිරීක්ෂණය විය. එහි ප්‍රතිඵලයක් ලෙස සුදුසුකම් නොලත් කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීම, යළි ඉදිකරන ලද මාර්ගවල ගුණත්වය අඩුවීම් ආදී විවිධ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය. විගණනය අතරතුර නිරීක්ෂණය වූ අවස්ථාවන් පහත දැක්වේ.

(අ) ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ ඇතා බැඳි වැව මැද මාර්ගයේ ප්‍රතිසංස්කරණය සඳහා භාවිතා කළ අමු ද්‍රව්‍යවල තැලීම, කොන්ක්‍රීට් මිශ්‍ර කිරීම හා ද්‍රව්‍යවල තත්ත්වය පිළිබඳ තත්ත්ව පරීක්ෂා සිදු කර නොමැති බව විගණකයින් විසින් සිදු කළ වැඩ බිම් පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ වාර්තා අනුව කොන්ක්‍රීට් මිශ්‍රණයේ දුර්වලතා හා බාල තත්ත්වයේ අමු ද්‍රව්‍ය භාවිතය නිසා මාර්ගයේ මීටර 0+100 සිට මීටර 0+310 දක්වා කොන්ක්‍රීට් කිරීම සෑහීමකට පත්විය හැකි පරිදි සිදු කර නැත. කෙසේ වෙතත් අඩු පාඩු පිළිසකර කිරීමට මාර්ගයේ මීටර 0+000 සිට මීටර 0+700 දක්වා කොන්ක්‍රීට් මතුපිට තාර යොදා තිබුණි.

(ආ) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 5.4.4 වගන්තියට අනුව,කොන්ත්‍රාත්කරු වෙත ගෙවීම් සියයට 90 ක් සිදු කිරීමට පෙර අත්තිකාරම් ගෙවීම් අය කර ගත යුතුය. කෙසේ වෙතත් ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ ඇතා බැඳි වැව මාර්ගයේ හා රොට වැව මාර්ගයේ පළමු මංතිරුව වැඩි දියුණු කිරීම සඳහා ගෙවන ලද මුළු අත්තිකාරමෙන් සියයට 38 ක් නියෝජනය වන රු. මිලියන 1.27 ක් පමණක් අවසාන බිල් පත් ගෙවන අවස්ථාව වන විට කොන්ත්‍රාත්කරුගෙන් අය කර ගෙන තිබුණි. ව්‍යාපෘති අධ්‍යක්ෂකට අනුව අත්තිකාරම්වල හිඟ ශේෂය පසුව අය කර ගෙන තිබුණි.

(ඇ) මඩකලපු දිස්ත්‍රික්කයේ මන්මුනෙයි උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කිලෝ මීටර 4.06 ක දිගක් සහිත ග්‍රාමීය මාර්ග 10 ක් යළි ඉදිකිරීම සඳහා ලැබුණු මිල කැඳවීම් 05 ක් අතරින් රු. මිලියන 54.9 කට ඉදිරිපත් කළ අඩුම මිල තෝරාගෙන තිබුණි. කෙසේ වෙතත් මිල කැඳවීමේ දී ඉදිරිපත් කළ වැඩ සඳහා රේට පසුව දෙවතාවක් වෙනස් කර තිබුණු බව විගණනයේදී අනාවරණය විය. එහි ප්‍රතිඵලයක් ලෙස තාක්ෂණික ඇගයීම් කමිටුවේ හා ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශ හා අනුමැතින් සහිතව ඉදිරිපත් කළ අඩුම මිල රු. මිලියන 91.5 ක් දක්වා වැඩිවී තිබුණි. තවද රජයේ 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශයෙහි 6.3.1 වගන්තියේ අවශ්‍යතාවය පරිදි ලංසුකරුවන් ලියවිලි වල පිටපත් මුද්‍රා තබන ලද කවරයක බහා ලබා දී නොතිබුණු බවද විගණන පරීක්ෂණ වලදී අනාවරණය විය.

## 3.4 මත භේදයට තුඩු දෙන කරුණු

--------------------------------

පහත කරුණු විගණනයේ දී නිරීක්ෂණය විය.

(අ) කොන්ත්‍රාත් 09 ක නියුතු කොන්ත්‍රාත්කරුවන්ට සිදු කළ එකතුව රු. මිලියන 54.63 ක අත්තිකාරම් මත ව්‍යාපෘතිය විසින් ඉල්ලුම් කළ වැඩ ආරම්භ කිරීමේ ඇප බැඳුම්කර වානිජ බැංකු

විසින් ප්‍රතික්ෂේප කර තිබුණු අතර ඒවා අදාල වානිජ බැංකු විසින් නිකුත් නොකරන ලද සහ ව්‍යාජ බැදුම්කර බව දන්වා තිබුණි.

(ආ) ව්‍යාපෘතිය විසින් ප්‍රදානය කළ කොන්ත්‍රාත් 09 කට අදාලව අගය රු. මිලියන 30.79 ක කාර්ය සාධන බැඳුම්කරවල වලංගු කාලය 2014 දී ඉකුත් වි තිබුණු අතර වලංගු කාලය දීර්ඝ කිරීමට ව්‍යාපෘතිය විසින් කළ ඉල්ලීම්, ලියකියවිලිවල සැකසහිත ස්වභාවය හේතුවෙන් වානිජ බැංකු විසින් තවදුරටත් ප්‍රතික්ෂේප කර තිබුණි. කෙසේ වෙතත් වැරදි නියෝජනයන් සිදු කිරීම වෙනුවෙන් කොන්ත්‍රාත්කරුට විරුද්ධව ක්‍රියාමාර්ග ගැනීමකින් තොරව රක්ෂණ සමාගම්වල කාර්ය සාධන බැඳුම්කර භාරගැනීම ප්‍රතික්ෂේප කර ඇති, ප්‍රතිග්‍රහන වැඩ භාර ගැනීමේ ලිපියේ වගන්තියට පටහැනිව පුද්ගලික අංශයේ රක්ෂණ සමාගමක් විසින් නිකුත් කළ නව කාර්ය සාධන බැඳුම්කර ව්‍යාපෘතිය පිළිගෙන තිබුණි.

(ඇ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 7.8 වගන්තිය අනුව, මිල ඉදිරිපත් කිරීමේ ලියවිලිවල ලංසුකරු අත්සන් කර නොතිබුණහොත් මිල ඉදිරිපත් කිරීම් ප්‍රතික්ෂේප කර තවදුරටත් සැලකිල්ලට භාජනය නොකළ යුතුය. කෙසේ වෙතත් මඩකලපු දිස්ත්‍රික්කයේ ඇස්තමේන්තු පිරිවැය රු. මිලියන 316 ක මාර්ග ප්‍රතිසංස්කරණ වැඩ, ලංසු ලියවිලි මත ඔවුන්ගේ අත්සන් තබා නොතිබුණු ලංසුකරුවන් වෙත ව්‍යාපෘතිය කොන්ත්‍රාත් 03 ක් පිරිනමා තිබුණි.

## 3.5 ව්‍යාපෘතියේ ඇවර කිරීමේ ගිණුම් සකස් කිරීම

2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘති ක්‍රියාකාරකම් නිම කර වත්කම්, ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වෙත බාර දී තිබුණද ඇවර කිරීමේ කටයුතු සඳහා ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාශන සකස් කර ඉදිරිපත් කර නොතිබුණි.